(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **101**.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2016 සැප්තැම්බර් මස 21 වැනි බදාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විශේෂ කාර්යභාර අමාත්‍යතුමා

ගරු **රවී කරුණානායක මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **චන්දිම වීරක්කොඩි මහතා,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩිලාන් පෙරේරා මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත රන්ගේ බණ්ඩාර මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා සහ බුද්ධශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මනුෂ නානායක්කාර මහතා,** විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික බණ්ඩාරනායක මහතා,** නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරානාත් බස්නායක මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා,** වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **දිළුම් අමුණුගම මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **රංජිත් අලුවිහාරේ මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා**

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය**

ගරු වේලු කුමාර් මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු සෙය්යිඩ් අලී සාහිර් මවුලානා මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරුෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු තිලක් මාරපන මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බිමල් රත්නායක මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**

**ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා**

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු කංචන විජේසේකර මහතා**

**ගරු එස්. වියාලේන්දිරන් මහතා**

**ගරු විමල් වීරවංශ මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු මුත්තු සිවලිංගම් මහතා**

**ගරු අන්නාමලෙයි නඩේසු සිවශක්ති මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

නීල් ඉද්දවල මහතා, වැඩබලන පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම** : (1) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2012 සහ 2013 වර්ෂ සඳහා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තා පිළිගන්වා, එම වාර්තා තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2012 වර්ෂය සඳහා ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) ස්වදේශ කටයුතු අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම් පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2014 වර්ෂය සඳහා ජාතික ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා විසින්, 2011 වර්ෂය සඳහා සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් පිළිගන්වා, එම වාර්තාව ව්‍යාපාර හා වාණිජ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) උසස් අධ්‍යාපන හා මහාමාර්ග කටයුතු අමාත්‍යතුමා විසින්, 2013 වර්ෂය සඳහා උක් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** (1) ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු චමල් රාජපක්ෂ මහතා විසින්, ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "2012 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව", "2015 වර්ෂය සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව", "2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව", "2012 වර්ෂය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව", "2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව", "2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව" සහ "2014 වර්ෂය සඳහා සී/ස ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ වාර්ෂික වාර්තාව" යන කාරණා සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු වඩිවේල් සුරේෂ් මහතා විසින්, අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "විශ්වවිද්‍යාල (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත," 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ නියමය"

සහ "1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ නියමය" යන කාරණා සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(3) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින්, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද "අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරියගේ වැටුප හා දීමනා ප්‍රතිශෝධනය කිරීම" සහ "ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයන් හා සාමාජිකයන් වෙත ගෙවනු ලබන පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා" පිළිබඳ යෝජනා සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**3. අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා :** "ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ)" යන නමින් යුත් පනත් කෙටුම්පත පිළිබඳ අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගේ වාර්තාව කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය විසින් ඉදිරිපත් කළාය.

පනත් කෙටුම්පත 2016 ඔක්තෝබර් මස 04 වැනි අඟහරුවාදා දෙවැනි වර කියවිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. පෙත්සම් :**

(1) (i) බත්තරමුල්ල, ජයවඩනගම, අංක 2බී/41 දරන ස්ථානයෙහි පදිංචි ඒ.එල්.පී.එස්. අබේදීර මහතාගෙන් ලැබුණු 2016.05.23 දිනැති පෙත්සම;

(ii) පිටිගල, පත්තිනිගොඩ යන ලිපිනයෙහි පදිංචි සිරිල් ජයසිංහ මහතාගෙන් ලැබුණු 2016.06.15 දිනැති පෙත්සම;

(iii) ගාල්ල, ආයුර්වේද රෝහලේ සේවය කරන (වෛද්‍ය) කේ. ඒ. කේ. නානායක්කාර මහතාගෙන් ලැබුණු 2016.05.29 දිනැති පෙත්සම;

(iv) ගාල්ල, ශ්‍රී ගුණරතන මාවත, අංක 38 ඒ දරන ස්ථානයෙහි පදිංචි කේ. ජී. රත්නසිරි මහතාගෙන් ලැබුණු 2016.06.17 දිනැති පෙත්සම;

(v) කටුනේරිය, "සියපත" යන ලිපිනයෙහි පදිංචි එල්. ඒ. එෆ්. වසන්ත ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු 2016.06.29 දිනැති පෙත්සම;

(vi) ගාල්ල, තලාපිටිය, බණ්ඩාරනායක පෙදෙස, අංක 30/1 දරන ස්ථානයෙහි පදිංචි එම්. එච්. එච්. රිෆායා මහත්මියගෙන් ලැබුණු 2016.08.03 දිනැති පෙත්සම;

(vii) ගාල්ල, චීන කොරටුව, ශ්‍රී දේවමිත්ත පාර, අංක 77 දරන ස්ථානයෙහි පදිංචි පී. කේ. අතුල මහතාගෙන් ලැබුණු 2016.07.25 දිනැති පෙත්සම;

(viii) නාවලපිටිය, හපුගස්තලාව, හල්ගොල්ලවත්ත යන ලිපිනයෙහි පදිංචි එස්. එම්. එල්. එස්. සිරිවර්ධන මහතාගෙන් ලැබුණු 2016.07.29 දිනැති පෙත්සම;

(ix) ගාල්ල, තල්පේ, කන්දෙවත්ත, හීනටිගල දකුණ යන ලිපිනයෙහි පදිංචි යූ. කේ. විජේසිරි මහතාගෙන් ලැබුණු 2016.07.01 දිනැති පෙත්සම;

(x) ගාල්ල, බෝපේ, වැකුණුගොඩ පටුමඟ, "නිෂාධි", අංක 13 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ජී. එස්. හරිස්චන්ද්‍ර මහතාගෙන් ලැබුණු 2016.06.14 දිනැති පෙත්සම; සහ

(xi) හික්කඩුව, වැවල, "දීපා" යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. ඩබ්ලිව්. ඒ. එස්. එස්. පී. ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු 2016.06.22 දිනැති පෙත්සම

ගරු වජිර අබේවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

(2) අම්බලන්තොට, ඕලුවිල, රොටවල පාර යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. එල්. පී. සනත් මහතාගෙන් ලැබුණු 2016.06.13 දිනැති පෙත්සම ගරු මහින්ද අමරවීර මහතා විසින් පිළිගන්වන ලදී.

(3) අක්මීමන, ඉහළගොඩ, ඉහළවත්ත යන ලිපිනයෙහි පදිංචි එම්. ජී. සමරපාල මහතාගෙන් ලැබුණු 2016.02.08 දිනැති පෙත්සම ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(4) ඇල්පිටිය, කුරුඳුගහහැතැක්ම, එල්. එම්. පී. මාවත, "පීරිස් විලා" යන ලිපිනයෙහි පදිංචි ඒ. කේ. ජී. ආනන්ද සිල්වා මහතාගෙන් ලැබුණු 2016.07.05 දිනැති පෙත්සම ගරු මනූෂ නානායක්කාර මහතා විසින් පිළිගන්වන ලදී.

(5) (i) දෙවිනුවර, කපුගම - බටහිර, "සරසවි" යන ලිපිනයෙහි පදිංචි ඒ. ජී. ආර්. සෙනෙවිරත්න මහතාගෙන් ලැබුණු 2016.07.28 දිනැති පෙත්සම;

(ii) හබරාදුව, "අමරවාස" යන ලිපිනයෙහි පදිංචි ජී. පී. අමරසේකර මහතාගෙන් ලැබුණු 2016.07.26 දිනැති පෙත්සම;

(iii) මාතර, නූපේ, විල්මට් බාලසූරිය මාවත, අංක 13, කම්කරු විනිශ්චය සභාවේ අංක 26 හි සේවය කරන එම්. අයි. එම්. සාහීර් මහතාගෙන් ලැබුණු 2016.07.28 දිනැති පෙත්සම;

(iv) මාතර, සුල්තානාගොඩ, කැකිල්ල යන ලිපිනයෙහි පදිංචි එම්. එම්. ඒ. රුවන් කුමාර මහතාගෙන් ලැබුණු 2016.08.02 දිනැති පෙත්සම; සහ

(v) වැලිගම, පැනැටියාන, මාරගහහේන යන ලිපිනයෙහි පදිංචි මහගමගේ සෝමා මහත්මියගෙන් ලැබුණු 2016.07.25 දිනැති පෙත්සම

ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(6) පුබ්බිලිය, මාරගමුව, අංක 19 දරන ස්ථානයෙහි පදිංචි පී. ජී. සුදන්ත පොඩිබණ්ඩාර මහතාගෙන් ලැබුණු 2016.07.02 දිනැති පෙත්සම ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු එස්. එම්. මරික්කාර් මහතා, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ආලෝකා සමාජ සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**6. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරියගේ වැටුප හා දීමනා ප්‍රතිශෝධනය කිරීම :** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (1) වගන්තිය අනුව කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් ඉටුකරලීම පිණිස එම කොමිෂන් සභාවට සහාය වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කිරීමට සහ එම තනතුර දරන තැනැත්තාට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන වැටුපක් ගෙවීමට විධිවිධාන සලස්වා දී ඇති හෙයින්ද;

අවධානමක් දැරිය යුතු තනතුරක් වන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට 2015.02.12 දින රජයේ අවශ්‍යතාවය මත නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් ධූරයේ රාජකාරි කළ ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය පත්කිරීම මත, ඇයට පෞද්ගලික වන සේ පහත සඳහන් වැටුප් හා දීමනා 2015.02.12 දින සිට ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) අතිරේක සොලිසිටර් ජනරාල් තනතුරට හිමි මාසික වැටුප සහ සියලු දීමනා (දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව සහ නිවාස කුලී දීමනාව හැර);

සහ

(ආ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධූරයට හිමි අමාත්‍යාංශ ලේකම් දීමනාව, දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව හා රජයේ නිල නිවාසයක් ලබාදී නොමැති නම් නිවාස කුලී දීමනාව.

ඊට අනුකූලව, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 2.58 ට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.)

"ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.23 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

"ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය"යි රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 5.29 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

(අ. භා. 6.03 ට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයන් හා සාමාජිකයන් වෙත ගෙවනු ලබන පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා :** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන් හා සාමාජිකයින් වෙත පහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා, අදාළ කොමිෂන් සභා සත්‍ය වශයෙන්ම රාජකාරි ආරම්භ කරන ලද දිනය, අදාළ ගෙවීම් බලාත්මක වන දිනය ලෙස සලකමින් ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) නිල බලයෙන් පත්වන සභාපතිවරයන් හැර අනෙකුත් සභාපතිවරයන් සඳහා රු. 100,000/-ක මාසික දීමනාවක් ද, රු. 10,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් සහ එකී වාහනය සඳහා ඉන්ධන ලීටර් 225ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්ද;

(ආ) නිල බලයෙන් පත්වන ස්වාධීන කොමිෂන් සභා සභාපතිවරයන් සඳහා තම නිත්‍ය තනතුරේ වැටුප් හා දීමනාවලට අතිරේකව, ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයෙකුගේ මාසික දීමනාවෙන් 50%ක මාසික දීමනාවක්ද;

(ඇ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාවේ හැර අනෙකුත් ස්වාධීන කොමිෂන් සභාවල නිල බලයෙන් පත් නොවන සාමාජිකයින් සඳහා රු. 75,000/-ක මාසික දීමනාවක්ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, තම පදිංචි ස්ථානයේ සිට කොමිෂන් සභා කාර්යාලයට යාමට ඇති දුර ප්‍රමාණය අනුව කිලෝ මීටර් 350 දක්වා රු. 25,000/-ක ප්‍රවාහන දීමනාවක් හෝ කිලෝ මීටර් 350ට වැඩි දුර ප්‍රමාණයක් වෙනුවෙන් රු. 50,000/-ක ප්‍රවාහන දීමනාවක්ද;

(ඈ) 2015.06.17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 3/2015 විධිවිධාන පරිදි නිල බලයෙන් පත්වන සාමාජිකයින් සඳහා එක් රැස්වීම් වාරයකට සහභාගී වීම වෙනුවෙන් රු. 10,000/-ක දීමනාවක්ද;

(ඉ) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ (8) වැනි වගන්තියට අනුව එම කොමිෂන් සභාවේ සභාපතිට හා සමානව සාමාජිකයන්ට ද බලතල පැවරී ඇති බැවින්, එම කොමිෂන් සභාවේ සාමාජිකයන්ට රු. 95,000/-ක මාසික දීමනාවක් ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් හා එම වාහනය සඳහා ඉන්ධන ලීටර් 170ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්;

සහ

(ඊ) මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයන් වෙත, මැතිවරණයක් ප්‍රකාශයට පත් කළ දින සිට ප්‍රතිඵල නිකුත් කරන දින දක්වා වූ කාලසීමාව සඳහා ඔවුන්ගේ මාසික දීමනාවෙන් ¾ක විශේෂ දීමනාවක් ද.

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන්ට හා සාමාජිකයන්ට ඉහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

ප්‍රශ්නය විමසන ලදින්, අංක 43 දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය අනුව පක්ෂව 68; විරුද්ධව නැත; යනුවෙන් බෙදී, සභා සම්මත විය.

**8. කල් තැබීම :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 6.37 ට, 2016 මාර්තු මස 08 වැනි දින සභා සම්මතිය අනුව 2016 සැප්තැම්බර් මස 22 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.